**<u>කො ළ ඹ දි සා අධිකරණ යේ දී ය</u>**

කොළඹ, ලෝටස් පාරේ, අංක.55, කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ, හොටේල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ්, සමාගම පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන්

ඉල්ලීම් අංකය:217/සීඕ

1982 අංක 17 දරණ සමාගම් පනතේ IX වන කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක කාරණයේ දී.

-එදිරිව-

**නිහාල් ශ්‍රී අමරසේකර,**
අංක.167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

**<u>පෙත්සම්කරු</u>**

වර්ෂ 2012ක් වූ ජූනි මස 28 වන දින දී ය.

ස්වකීය නීතිඥ එන්.වයි.කුණසීලන් මහත්මිය මගින් පෙනී සිටින විරුද්ධ වන ණය හිමියන් දෙදෙනෙකු වන කෝර්නල් ලයනල් පෙරේරා සහ කෝර්නල් ඇන්ඩ් කම්පනි ලිමිටඩ්, මැදිහත් වන වගඋත්තරකරුවෙකු යන පදනම මත ඈවර කිරීමට යෝජිත සමාගම වන හොටෙල් ඩෙවලපර්ස් (ලංකා) පී.එල්.සී. සහ ගරු නීතිපති තුමා විසින් ගොනු කරනු ලැබූ 2012 මාර්තු මස 15වන දිනැති එක හා සමාන මෝසම් දෙකෙහි අන්තර්ගත ඉල්ලීම සම්බන්ධයෙන් සිය **විරෝධතා ප්‍රකාශය** මගින් පහත පරිදි ප්‍රකාශ කර සිටියි :-

01. ඈවර කිරීමට යෝජිත සමාගම වන හොටෙල් ඩෙවලපර්ස් (ලංකා) පී.එල්.සී. (මෙහි මින්මතුවට **"HDL"** ලෙස හඳුන්වනු ලබන) සහ ගරු නීතිපතිතුමා මැදිහත්කාර වගඋත්තරකරුවකු ලෙස 2012 මාර්තු මස 15වන දිනැතිව එක හා සමාන වන මෝසම් දෙකක් (2) ගොනු කරනු ලැබීය.

02. 2012 මාර්තු මස 15වන දින මෙම නඩුව අධිකරණයේ ගනු ලැබූ අවස්ථාවේ දී, පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටින ජ්‍යෙෂ්ට නීතිඥවරයා සහ කෝර්නල් පෙරේරා සහ කෝර්නල් ඇන්ඩ් කම්පනි ලිමිටඩ් (මෙහි මින්මතුවට **"කෝර්නල්"** යනුවෙන් හඳුන්වනු ලබන) වෙනුවෙන් පෙනී සිටින ජ්‍යෙෂ්ට නීතිඥවරයා මෙන්ම විරුද්ධ වන ණයහිමියන්/දායකයන් (contributories) දෙදෙනෙකු වන මිට්සුයි ඇන්ඩ් කම්පනි ලිමිටඩ් සහ ටායිසේ කෝපරේෂන්ද, (මෙහි මින්මතුවට **"මිට්සුයි සහ ටායිසේ"** යනුවෙන් හඳුන්වනු ලබන) වෙනුවෙන් පෙනී සිටින ජ්‍යෙෂ්ට නීතිඥවරයා ද එකී මෝසම/ඉල්ලීමට විරුද්ධ වන ලදී.

03. මූලිකවම, ලිඛිත විරෝධතා ගොනු කරන ලෙස අධිකරණය පාර්ශ්වයන්ට නියම කරන ලද අතර මින් පෙර සඳහන් කර ඇති 2012 මාර්තු 15වන දිනැති උද්දේශික මෝසම් දෙක (2) සම්බන්ධව කෝර්නල් වෙනුවෙන් මෙම ලිඛිත විරෝධතා ගොනු කරනු ලබයි.

04. මුල් අවස්ථාවේ දීම, විරුද්ධ වන ණයහිමියන්/දායකයන්(contributories) දෙදෙනා වන කෝර්නල් එකී මෝසම් වල ප්‍රකාශිත සියලුම කරුණු එක්ව සහ වෙන්වෙන්ම ප්‍රතික්ෂේප කරන අතර විශේෂිතවම ප්‍රකාශ කර සිටින්නේ, ඈවර කිරීමට යෝජිත සමාගම වන HDL විසින් ගනු ලැබූ ස්ථාවරයට මෙන්ම මහභාණ්ඩාගාර ලේකම් නියෝජනය කළ ගරු නීතිපති තුමා ගනු ලැබූ ස්ථාවරයට මෙම මෝසම් පටහැනි වන බවයි.

05. මූලිකවම, කෝර්නල් ප්‍රකාශ කර සිටින්නේ, එකී උද්දේශිත මෝසම් කාර්ය පටිපාටියට අනුකූල පිළිගත නොහැකි සහ මෙලෙස තීරණය කළ නොහැකි බවයි. එනම්-

(අ) ගොනු කරනු ලැබූ උද්දේශිත මෝසම් දෙකක් පමණක් ඇති බවත්;

(ආ) මෙම ඉල්ලීම නිශ්ප්‍රභ කර ගැනීමට සහ/හෝ අවසාන කර ගැනීමට මේ ආකාරයෙන් මෝසමක් ගොනු කිරීමට කිසිදු ප්‍රතිපාදනයක් නොමැති බවත්;

(ඇ) කිසිදු පුද්ගලයෙකුගේ කිසිදු දිවුරුම් ප්‍රකාශයක් මගින් එකී උද්දේශිත මෝසම් තහවුරු කර නොමැති බවත්;

(ඈ) කිසිදු සාක්ෂියක් මගින් එකී උද්දේශිත මෝසම් වල අඩංගු කරුණු තහවුරු කර නොමැති බවත්;

(ඉ) අධිකරණය ඉදිරියේ නිසි සහ වලංගුයැයි හඳුනාගත හැකි ඉල්ලීමක් නොමැති බවත්;

(ඊ) එකී උද්දේශිත මෝසම් වල සාවද්‍ය සහ නිරවද්‍ය නොවන ස්ථාවරයන් විශේෂයෙන්ම, HDL විසින් මෙන් ම මහභාණ්ඩාගාර ලේකම් වෙනුවෙන් නීතිපතිතුමා විසින් ගොනු කරනු ලැබ ඇති එකී උද්දේශිත මෝසම්වල ඔවුන් විසින් ගනු ලැබූ පටහැනි ස්ථාවරයන් අන්තර්ගත ව( බවයි.

06. මෙකී මෝසම් වල ප්‍රකාශිත කරුණු HDL විසින් මෙන් ම මහභාණ්ඩාගාර ලේකම් විසින් මෙම නඩුවේ ගනු ලැබූ ස්ථාවරයන්ට පටහැනි වන්නේ, සියලුම අවස්ථාවන් හිදී සහ විශේෂයෙන්ම HDL විසින් සහ ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් මහභාණ්ඩාගාර ලේකම් විසින් ගොනු කරනු ලැබූ විරුද්ධවී මේ දිවුරුම් ප්‍රකාශ වල HDL ඒවා සමාගමක් බවත් විසුරුවා හැරීම සඳහා කිසිදු පදනමක් නොපවතින බවත් ප්‍රකාශ කර ඇති නිසා බව කෝර්නල් විශේෂයෙන්ම අයැද සිටියි.

07. කෙසේ වුවද, ගොනු කරනු ලැබූ උද්දේශිත මෝසම් දෙක හි ඇවර කිරීමට යෝජිත සමාගම වන HDL ට ගෙවිය යුතු ණය පියවිය නොහැකිය සහ එය අරාජික තරමට බංකොලොත් වී ඇති බව HDL සහ මහභාණ්ඩාගාර ලේකම් විසින් ගෙන ඇති ස්ථාවරය වේ.

08. කෝර්නල් විශේෂිතවම ප්‍රකාශ කර සිටින්නේ, HDL සහ ගරු නීතිපති ගොනු කරනු ලැබූ උද්දේශිත මෝසම් අසද්භාවී බවයි.

09. HDL සහ ගරු නීතිපති විසින් ගොනු කරනු ලැබූ එකී මෝසම් වල උපාන්තික (penultimate)ජේදය විශේෂයෙන්ම ප්‍රතික්ෂේප කරන කෝර්නල් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ එහි ප්‍රකාශිත කරුණු නිවැරදි නොවන බවයි.

10. කෝර්නල් විශේෂයෙන්ම ප්‍රකාශ කර සිටින්නේ, පාර්ශවයන්ගේ අයිතිවාසිකම් තීරණය වන්නේ නඩුව ගොනු කරන දිනට වන අතර ඉන්පසු සිදුකරන යම් ක්‍රියාවක් නඩුවක් අසා තීරණය කිරීමට අධිකරණයට ඇති බලය/හිමිකම ඉවත් නොකරයි.

11. 2006 නොවැම්බර් මස 17වන දින මෙම ඇවර කිරීමේ ඉල්ලීම ගොනු කරන විට ක්‍රියාපාත්නා වූ 2011 අංක.43 දරන පනත ක්‍රියාත්මක නොවුන අතර 2007 අංක.7 දරන සමාගම් පනතේ 277 වන වගන්තිය ප්‍රකාරව ඇවර කිරීමේ ඉල්ලීම ආරම්භ කර තිබුණේ 2006 නොවැම්බර් මස 17වන දින වන අතර එසේ හෙයින් සහ කෙසේ වෙතත් මෙකී ඉල්ලීම් මෙම අදියරයේ දී භාරගත නොහැක.

12. කෝර්නල් විශේෂයෙන්ම ප්‍රකාශකර සිටින්නේ, මෙම ඉල්ලීමේ හරය මතම එය තීරණය කිරීමට මෙම අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවයි.

13. කෝර්නල් වැඩිදුරටත් කියා සිටින්නේ, HDL සහ ගරු නීතිපති විසින් ගොනු කරනු ලැබූ උද්දේශිත මෝසම් නීතියට අනුකූලව යුක්තිය නිසිලෙස ක්‍රියාත්මක කරළීම වැළැක්වීමක් වන බවයි.

එසේහෙයින් කෝර්නල් ලයනල් පෙරේරා සහ කෝර්නල් ඇන්ඩ් කම්පනි ලිමිටඩ් අයැද සිටින්නේ-

(අ) HDL සහ ගරු නීතිපතිතුමා විසින් ගොනු කරනු ලැබූ 2012 මාර්තු මස 15වන දිනැති උද්දේශිත මෝසම් ප්‍රතික්ෂේප කරන ලෙසත්;

(ආ) ඇවර කිරීමේ ඉල්ලීම එහි හරයන් මතම අධිකරණය විසින් ඉදිරියට පවත්වාගෙන යන ලෙස සහ තීරණය කරන ලෙසත්;

(ඇ) නඩු ගාස්තු; සහ

(ඇ) මෙම අධිකරණයට මැනවැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහනයන් ලබා දෙන ලෙසත් ය.

කෝර්නල් ඇන්ඩ් කම්පනි ලිමිටඩ් සහ කෝර්නල්
ලයනල් පෙරේරා ගේ නීතිඥ

<u>සකස් කරන ලද්දේ:</u>

නීතිඥ එස්.සෝමරත්න මෙනවිය,

නීතිඥ එම්.එම්.එම්.පී.මනතුංග මහතා,

නීතිඥ නාගලිංගම් ආර්. සිවේන්ද්‍රන් මහතා,

ජනාධිපති නීතිඥ එස් සිවරාසා මහතා
විසිනි.

7e-Sin-ple-dc-Obj-217-CO-Motion